සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

நிதி அமைச்சு
சமுர்த்தி,வதிவிடப் பொருளாதார,நுண்நிதிய,சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு

Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development

මගේ අංකය
எனது DSD/HO/EP/06/10/ව්‍යා.සතිපොල
My No

ඔබේ අංකය
உமது இல ........................
Your No

දිනය
திகதி 2021.04.30
Date

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
.......................................

**දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යවසාය සතිපොල වැඩසටහන.**

රට හදන **"සෞභාග්‍යයේ දැක්ම"** ප්‍රතිපත්ති ප්‍රකාශය සහ ගෘහාශ්‍රිත කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන ජනාධිපති කාර්ය සාධන බලකායේ වැඩසටහනට අනුගත වෙමින්, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය මගින් දිවයින පුරා විසිරී සිටින තරුණ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන අලෙවි කිරීමේ ගැටළුවට ප්‍රාදේශීය මට්ටමින් විසඳුම් සෙවීම අරමුණු කරගෙන දිවයින පුරා විශේෂ සතිපොල 100ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. (යෝජිත සටහන අමුණා ඇත)

02. සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදන ක්ෂේත්‍රයේ නියැලෙන තරුණ ව්‍යවසායකයින් ග්‍රාමීය මට්ටමේ සිට ජාතික තලය දක්වා ඔසවා තැබීම සඳහා අවශ්‍ය දිරිගැන්වීම සිදු කිරීම මෙම වැඩසටහනේ ප්‍රමුඛතම අරමුණ වේ. මෙම ව්‍යවසාය සතිපොල දිවයින පුරා දැනට සතිපොල පවත්වා ගෙන යනු ලබන පරිශ්‍රයන්හි සතිපොල නොපවත්වන දින යොදා ගෙන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

03. මෙම වැඩසටහන තරුණ හා ක්‍රීඩා කටයුතු අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාගේ උපදෙස් හා සෘජු මගපෙන්වීම යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ.

04. යෝජිත සතිපොල තුළ අප අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව යටතේ ගොඩනැගුනු සහ එම පොලවල් ආසන්න ප්‍රදේශයන්හි පදිංචි ව්‍යවසායකයින්ට සිය නිෂ්පාදන අලෙවි කර ගැනිමට අවස්ථාව ලබා දිය හැකිය. එබැවින් ඔබ දිස්ත්‍රික්කයේ සමෘද්ධි කාර්ය මණ්ඩලය මෙම වැඩසටහන පිලිබඳව දැනුවත් කර සුදුසු ව්‍යවසායකයින් සම්බන්ධ කිරීමෙන් සතිපොල වැඩසටහන සාර්ථක කර ගැනීමටත්, මෙම වැඩසටහනට ව්‍යවසායකයින් සම්බන්ධ කරවා ඔවුන්ගේ ආර්ථිකය හා ජීවන මට්ටම ඉහල නැංවීමටත් අවශ්‍ය කටයුතු සම්පාදනය කරන මෙන් කාරුණිකව දන්වමි.

06. මෙ සම්බන්ධව ඔබගේ විශේෂ අවධානය යොමු කරනු ඇතැයි උදක්ම බලාපොරොත්තු වන අතර වැඩසටහන සාර්ථක කර ගැනීම සම්බන්ධව ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ජේ.ජී.වෙල්ලප්පිලි
අධ්‍යක්ෂ (ආර්ථික සවිබල ගැන්වීම් හා ග්‍රාම සංවර්ධන)
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

පිටපත් - 01. ලේකම්, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
02. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 28 |